**ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.38,250,000 ක් වූ ප්‍රතිපාදනයෙන් එකතුව රු.38,147,320 ක් හෙවත් සියයට 100 ක හා සියයට 99.72 ක පරාසය තුළ උපයෝජනය නොකර ඉතිරි වි තිබුණි. | E.W. Information System Ltd ආයතනයේ දුර්වල කාර්ය සාධනය නිසා අදාළ ව්‍යාපෘතිය අවසන් කිරිම හේතුවෙන් මෙම ශීර්ෂයන් යටතේ ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබිණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු විම. |

### 2.2 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ ඒසීඒ - 07 ආදර්ශ ආකෘතිය ප්‍රකාරව අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් “බී” ගිණුමට කරන ලද බැර කිරීම් හා අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතන විසින් අත්තිකාරම් “බී” ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් ලෙස වෙන් වෙන්ව දැක්විය යුතු විය. එහෙත් අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් “බී” ගිණුමට කරන ලද බැර කිරීම රු.2,566,717 ක් හා අනෙකුත් ශීර්ෂවලට දෙපාර්තමේන්තුව විසින් අත්තිකාරම් “බී” ගිණුම් කටයුතු වෙනුවෙන් කරන ලද හර කිරීම් රු.1,223,786 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වෙන් වෙන්ව නොදක්වා අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් “බී” ගිණුමට කරන ලද බැර කිරීම් යටතේ එකතුවක් ලෙස රු.3,790,119 ක් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි. ආපදා ණය මුදලක් පියවීමේදී ණය මුදල සමඟ අදාළ පොලී මුදල වන රු.192.00 ක් ද එකතු කර ගිණුම්ගත කර තිබුණු අතර මාරු පත්‍ර මගින් නිවැරදි කිරීමේදී දෙවරක් ගිණුම්ගත වීම නිසා මෙම වෙනස ඇතිවී තිබේ. | මූල්‍ය ප්‍රකාශන සැකසීමේ මාර්ගෝපදේශය පරිදි කටයුතු කළ යුතු වීම. |

## 2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාන මාරු වී ගිය නිලධාරිනියකගෙන් ආපදා ණය හා උත්සව අත්තිකාරම් වශයෙන් එකතුව රු. 232,858 ක් අයවිය යුතුව තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට වසර 02 ක් ඉක්මවා තිබුණ ද, මෙම හිඟ ණය ශේෂ අයවී නොතිබුණි. | 2022 වර්ෂය තුළ උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති බැවින්, 2023 වර්ෂය තුළ එම ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව පළාත් අධ්‍යක්ෂ විසින් 2022.09.20 දිනැති ලිපිය මගින් දන්වා ඇත. මේ වන විටත් අත්තිකාරම් බී ණය සඳහා ප්‍රතිපාදන නොලැබී ඇති බව දුරකථන මගින් අප විසින් විමසීමේදී දන්වා ඇත. කෙසේ වෙතත්, 2023.03.23 දින මේ සම්බන්ධයෙන් දෙවන සිහි කැඳවීමේ ලිපියක්ද යොමු කර ඇත. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු වසර 7 ක කාලයක් ඉක්මවූ රු.139,921 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය වී නොතිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත, අධිකරණයේ කටයුතු සඳහා පෞද්ගලික ලිපිගොනුවේ මුල් පිටපත් අවශ්‍ය වුවහොත් කඩිනමින් ලබාදීමේ පදනමින් අදාළ සේවක මහතාගේ පෞද්ගලික ලිපිගොනුව නැවත සේවයේ පිහිටුවීම සලකා බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා 2022.11.08 දින ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර ඇත. ණය අයකර ගැනීම සඳහා අධිකරණයේ නඩු කටයුත්තක් සිදු වෙමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, චක්‍රලේඛයේ 3(අ) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය, සංවිධාන ව්‍යුහය හා | 2022 වර්ෂය සඳහා සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම සමඟ යාවත්කාලීන කළ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය, සංවිධාන ව්‍යුහය වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට අන්තර්ගත කර නොතිබුණ ද අදාල ලේඛන හා වාර්තා වෙන් වෙන් වශයෙන් සකස් කර තිබූ බවත්, විශේෂයෙන් 2022 ප්‍රසම්පාදන සැලැස්ම ව්‍යාපෘති සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍යාංශයෙන් අනුමත කර ගෙන තිබූ බවත් සඳහන් කරමි. 2023 වර්ෂයේ | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | |
|---|---|
| වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම එම ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට මෙම ලේඛන වාර්තා ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

### 3.1.2 කාර්යභාරයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය සහතික කරනු වස් සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය, ඇගයීම සහ පහසුකම් සැලසීම මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ආයතන වෙත උපදේශනය ලබා දෙමින් සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම තුළින් එකඟ වූ කාලරාමුව සහ පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වූ අතර, සියලුම කාර්යයන් ඒ අනුව හඳුනාගෙන තිබුණි. එම කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබූ ක්‍රියාකාරකම් 02 ක් සම්බන්ධව කිසිඳු ප්‍රගතියක් අත් කරගෙන නොතිබුණු අතර, තවත් ක්‍රියාකාරකම් 03 ක අරමුණු කරා ළඟා වීම සියයට 51 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | රටෙහි ඇති වූ අර්බුධකාරී ආර්ථික වාතාවරණය තුළ "සෞභාගයේ දැක්ම" ක්‍රියාත්මක කිරීම අපහසු වීම, දෙපාර්තමේන්තුවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කර ගැනීම සඳහා වෙබ් පාදක ව්‍යාපෘති අධීක්ෂණ මෘදුකාංග වැඩසටහනක් සකස් කිරීමට දේශීය ආයතනයකට කොන්ත්‍රාත්තුව පැවරුව ද අදාළ කාර්යය ඉටුකිරීම සඳහා එම ආයතනය අපොහොසත් වීම, 2012 වර්ෂය වන තෙක් දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මකව පැවති ව්‍යාපෘති අධීක්ෂණය සඳහා භාවිතා කළ පරිගණක මෘදුකාංගය නැවත සක්‍රීය කර ගැනීමට ඇති හැකියාව හා ඒ සඳහා සංවර්ධන පාර්ශවකරුවෙකුගේ ආධාර ලබා ගැනීම සඳහා දිගින් දිගටම උත්සාහ කරමින් සිටී. | සැලසුම් කළ පරිදි අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දේශීය හා විදේශීය මූල්‍යයනය මත විවිධ රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ විශාල සහ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව 261 ක් වී තිබූ අතර, එයට විශාල පරිමාණ ව්‍යාපෘති 150 ක් හා මහා පරිමාණ ව්‍යාපෘති 111 ක් අයත් විය.<br><br>සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිම කිරීමට නියමිතව තිබූ ව්‍යාපාති 109 ක් අතුරින් ව්‍යාපෘති 29 ක් පමණක් අවසන් ව්‍යාපෘති ප්‍රතිඵලය ජනනය කිරීමට සමත්ව තිබුණු අතර, කාර්යසාධන ගැටළු හේතුවෙන් මහා පරිමාණ ව්‍යාපෘති 29 ක් වර්ෂ අවසානය වන විට අත්හිටුවා තිබුණු බැවින්, ව්‍යාපෘති කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතුණි. මේ අනුව, සම්පත් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම තුළින් එකඟ වූ කාලරාමුව සහ පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම සඳහා වූ අරමුණ අපේක්ෂිත පරිදි ඉටුවී නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති 261 සම්බන්ධයෙන් මාසිකව අධීක්ෂණ කටයුතු සිදු කළ අතර, කාර්තුමය වශයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්තා 04 ක් සකස් කරන ලදී. (පළමු කාර්තු වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය.)<br>මෙම ප්‍රගති පරීක්ෂා වලින් පසුව ඒ සම්බන්ධව නිරීක්ෂණ අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත යොමු කෙරේ. තව ද 2022 වර්ෂයේ අප්‍රේල් මාසයෙන් පසු ඇති වූ මූල්‍ය කළමනාකරණ තත්ත්වය තුල බොහොමයක් විදේශ ණය ව්‍යාපෘති සඳහා මූල්‍යනය අත්හිටවූ බැවින් හා අමුද්‍රව්‍ය හිඟය, ඉන්ධන හිඟය, ආනයන සීමා ආදිය හේතුවෙන් ව්‍යාපෘති ඉදිරියට ගෙන යාමට නොහැකි විය. එම තත්ත්වයන් ව්‍යාපෘති අධීක්ෂණය තුලින් පාලනය කළ නොහැකි බව පැහැදිලි කරුණකි. | සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කර එකඟ වූ කාල රාමුව හා පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල අත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | විවිධ ආයතන නියෝජනය කළ ඉහළ රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වීම තුළ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා මෙහෙයුම් කමිටුවක් පත් කර එහි මගපෙන්වීම හා සහාය මත දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේදී ජාතික ඇගයුම් ප්‍රතිපත්තියක් සකස් කර ඇති බව කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවා නොතිබුණු බව නිරීක්ෂණය විය. | ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය 2019 වර්ෂය තුල දී සකස් කර තිබුණ ද එය ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ සියලු ආයතන වල අදාල නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම් කටයුතු කළ යුතුය. එමෙන්ම තෝරාගත් නිලධාරීන් හා එක්ව ව්‍යාපෘති ඇගයීමේ නියමු වැඩසටහන් කීපයක් සම්පූර්ණ කළ යුතුය. 2021 හා 2022 වර්ෂයේ ඒ සඳහා සුදුසු වාතාවරණයක් හා මූල්‍ය ප්‍රතිපාදන නොලැබුණ බැවින් ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවිය නොහැකි විය. එහෙත් මේ වන විට “ ඇමරිකානු අන්තර්ජාතික සංවර්ධන ඒජන්සියේ ” මූල්‍ය සහයෝගීතාවය යටතේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ කටයුතු සිදු කරමින් පවතී. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා රු.මිලියන 127.5 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ එයින් රු.මිලියන 82.78 ක් හෙවත් සියයට 65 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | මුදල් අමාත්‍යාංශයෙන් නිකුත් කල වියදම් පාලන චක්‍රලේඛය හා ජනාධිපති කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද වියදම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි වියදම් කළමනාකරණය සිදුකරන ලදි. එසේම දුර්වල කාර්ය සාධනය හේතුවෙන් බහුතරයක් ප්‍රතිපාදන වෙන්ව තිබූ ව්‍යාපෘති අධීක්ෂණ තොරතුරු පද්ධතිය සකස් කිරීමේ ව්‍යාපෘතිය අත්හිටුවීමට සිදු වීමද මෙම ප්‍රතිපාදන ඉතිරියට බලපා ඇත. | දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සලසාගෙන තිබුණු ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම |

**3.2 වත්කම් කළමනාකරණය**

පහත නිරික්ෂණයන් කෙරේ.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙතින් විධිමත් පවරාගැනීමකින් තොරව වාහන 02 ක් දෙපාර්තමේන්තුවේ පරිහරණයට ලබාගෙන තිබුණි. | නිල වාහන හිමි නිලධාරීන් දෙදෙනෙකු සඳහා වෙන් කර ලබා දීමට සුදුසු නිල රථ මෙම දෙපාර්තමේන්තුව සතුව නොපැවති බැවින්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් ලබා ගෙන ඇත. | විධිමත් පරිදි පවරා ගැනීමට හෝ නැවත එම ආයතන වෙත ලබා දීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත නැවත භාරදිය යුතු බවට තීරණය කර තිබුණු දෙපාර්තමේන්තුව සතු ධාවනයෙන් ඉවත් කරන ලද මෝටර් රථ 02 කට අදාළ ලියවිලි හා තොරතුරු 2020 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විධිමත් පරිදි පවරාදීමේ කටයුතු සිදුවී නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව සතු ධාවනයෙන් ඉවත් කරන ලද මෝටර් රථ 02 ක විධිමත් පරිදි පවරා ගැනීමට අදාල සියලු ලියකියවිලි මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | විධිමත් පරිදි පවරා දීම සඳහා කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 වර්ෂයේ අවසාන දිනට අදාළව සිදු කරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ ඉන්වෙන්ට්‍රි ලේඛනය තුළ ඇතුළත් Laptop පරිගණකය සමඟ බෑගයක ඌනතාවයක් පැවතීම හා ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සඳහන් අයිතමයන් භෞතිකව හඳුනාගැනීමේ නිසි කේත අංක සඳහන් කර නොතිබීම නිරීක්ෂණය විය. තවද, ඌනතා ලෙස දක්වා තිබුණු රු.244,432 ක් වටිනා Laptop පරිගණකය සමඟ බෑගය සමාලෝචිත වර්ෂයේදී සොරකම් කර තිබුණු බව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සටහන් (i) මඟින් දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අදාළ වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි.<br>ඌනතාවය අනාවරණය වී ඇත.<br>දෙපාර්තමේන්තුවේ අවසරය මත රාජකාරි අවසන්ව නිවසට රැගෙන යන අවස්ථාවක දී එය සොරකම් කර ඇති අතර, ඒ සම්බන්ධව පොලීසියට පැමිණිලි කර දෙපාර්තමේන්තුවට ද දන්වා ඇත. ඒ සම්බන්ධව මු.රෙ. 104 යටතේ මූලික පරීක්ෂණය සිදු කර ඇත. නිලධාරිනිය වෙත පොලීසිය මඟින් එය සොයා ගත හොත් දැනුම් දෙන බව දන්වා තිබූ බැවින්, නිලධාරිනියගෙන් මුදල් අයකර ගැනීම යම් ප්‍රමාදයකට ලක් කරන ලදී. නමුත් දැනට අදාල නිලධාරිනියගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අදාළ වටිනාකම අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම හා වත්කම් හඳුනා ගැනීමේ කේත අංක භාවිතා කළ යුතු වීම. |

**3.3**

**තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් හා වැඩසටහන්වල අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමේ ප්‍රගතීන් අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ කාර්යභාරයන්හි ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ. | | |
| (අ) | ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සැකසුම් මට්ටමේ පවත්නා බැවින් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ දර්ශක 03 ක් සම්බන්ධව කිසිඳු ප්‍රගතියක් ලබා නොතිබුණි. | පිළිගනිමි.<br>සංවර්ධන තොරතුරු පද්ධතිය සකසා නොමැති වීමෙන් මෙම ඌන ප්‍රගතිය අත් වී ඇත. | තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු හා පහසුකම් සැලසිය යුතු තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ දර්ශක 03 ක අරමුණු ළඟා වීම සියයට 49 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | පිළිගනිමි. ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව සකසා නොතිබීම හේතුවෙන් මෙම අඩුපාඩුව සිදු වී ඇත. | තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

4. **මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 102 ක් වූ අතර ඉන් තනතුරු 30 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 08 ක්ද, තෘතියික මට්ටමේ 04 ක් හෙවත් අනුමත ප්‍රමාණයෙන් සියයට 100 ක් හා ද්විතීයික මට්ටමේ තනතුරු 13 ක් ද විය. | පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් මෘදුකාංග පද්ධතිය හරහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. මෙම පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමේ බලතල මෙම දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර ක්‍රියාවලියක් වන අතර, සේවයේ නිරත කාර්ය මණ්ඩලයෙන් කාර්යක්ෂමව සේවාවන් ලබා ගනිමින් දෙපාර්තමේන්තුවේ කර්තව්‍යයන් නියමිත පරිදි ඉටුකිරීමට කටයුතු කර ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමටත්, එසේ නොවන තනතුරු තිබේ නම් ඒවා අනුමත කාර්ය මණ්ඩලයේ සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |